මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 05.06.2026

## මාධ්‍ය නිවේදනය

### පළමු අදියර සාර්ථකව ක්‍රියාත්මක කරන ලද ඩිජිටල් ඉන්වොයිස් ක්‍රමවේදය දෙවන අදියර ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

2026 අයවැය කතාවට අනුකූලව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) මේ වනවිට ඩිජිටල් ඉන්වොයිස් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සාර්ථකව ඉදිරියට ගෙන ගොස් ඇති අතර, බදු පරිපාලන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් වේගවත් කිරීම සහ ජාතියක් ලෙස ශ්‍රී ලංකාව විසින් ආරම්භ කර ඇති ඩිජිටල් ගමනට පහසුකම් සැලසීම සඳහා අනුකූලතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ව්‍යුහගත මෙන්ම අදියරගත (අදියර 1 - SVAT බලපෑමට ලක් වූ අපනයනකරුවන්, අදියර 2 - VAT ලියාපදිංචි ව්‍යාපාර සහ අදියර 3 - POS ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම) දියත් කිරීමක් හරහා සැලකිය යුතු ප්‍රගතියක් සනිටුහන් කර ඇත.

### අදියර 1: 2025 ඔක්තෝබර් මාසයේ සිට අපනයනකරුවන් පද්ධතිගත කිරීම

ආර්ථිකයේ ප්‍රධාන අංශවල ශක්තිමත් සහභාගීත්වයෙන් ඩිජිටල් ඉන්වොයිස් පද්ධතියේ පළමු අදියර සාර්ථකව ඉදිරියට යමින් පවතී. මේ සඳහා සමාගම් 340 කට අධික සංඛ්‍යාවක් ස්වේච්ඡාවෙන් සම්බන්ධ වී ඇති අතර, විශේෂයෙන් එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ වේගවත් ක්‍රියාවලිය හරහා දැනටමත් ප්‍රමාණාත්මක ප්‍රතිලාභ අත්විඳිමින් සිටිති.

ඩිජිටල් ඉන්වොයිස් ක්‍රමවේදය ඉතා වේගවත් ප්‍රතිසංස්කරණයක් සමඟින් සම්පූර්ණයෙන්ම පද්ධති පාදක සැසඳීම (System Based Reconciliation) මගින් ව්‍යාපාර සඳහා එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් කඩිනම් කිරීමට පහසුකම් සපයනු ලබයි.

මෙම පද්ධතියට සම්බන්ධ වී ඇති අංශ අතරට ඇඟලුම් අපනයනකරුවන් සහ තේ තැරැව්කරුවන් හරහා තේ නිෂ්පාදකයින් ද ඇතුළත් වේ. මුදල් ආපසු ලබාගැනීමේ සැකසුම් කාලයන් සැලකිය යුතු ලෙස වේගවත් වීම හරහා මෙම පාර්ශ්වකරුවන් මේ වන විට ප්‍රතිලාභ ලබමින් සිටින අතර, බොහෝ අවස්ථාවලදී දින කිහිපයක් ඇතුළත මුදල් ආපසු ලබාගැනීමට සුදුසුකම් ලබයි.

### අදියර 2: එකතු කළ අගය මත ලියාපදිංචි ව්‍යාපාර පද්ධතිගත කිරීමේ ක්‍රියාවලිය 2026 අප්‍රේල් මාසයේදී ආරම්භ විය.

මෙම ක්‍රියාත්මක කිරීමේ දෙවන අදියර දැනට ආරම්භවී ඇති අතර, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති ස්වේච්ඡා පදනමක් මත එකතු වීමට කැමැත්තක් දක්වන සියලුම ව්‍යාපාර දක්වා පද්ධතිය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

පද්ධතියට සම්බන්ධ වීමට කැමැත්ත පළ කර ඇති මහා පරිමාණ නිෂ්පාදන ව්‍යාපාර සහ සිල්ලර වෙළෙඳ ව්‍යාපාර සමඟ මේ වන විටත් සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද අතර දැනටමත් අපනයනාභිමුඛ සමාගම් 27 ක් සහ තවත් එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නිෂ්පාදකයින් 170

ක් සමඟ තාක්ෂණික ලියකියවිලි සහ ඒකාබද්ධ කිරීමේ මාර්ගෝපදේශ හුවමාරු කරගෙන ඇත. එමඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද ඩිජිටල් ගමනට සම්බන්ධ වීමට පෞද්ගලික අංශයේ ඇති විශ්වාසය සහ කැමැත්ත පෙන්නුම් කෙරේ.

දෙවන අදියර සැලසුම් කර ඇත්තේ එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ව්‍යාපාරවලට ඩිජිටල් වේදිකාව මඟින් පිරිනමනු ලබන කාර්යක්ෂමතාවයෙන් යුත් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කඩිනමින් සම්බන්ධ වීමට සහ සුමට සංක්‍රාන්තියකට සූදානම් වීමට අවස්ථාවක් ලබා දීම සඳහා ය.

## අදියර 3: ඩිජිටල් ගමන වේගවත් කිරීම සඳහා POS යන්ත්‍ර හඳුන්වා දීම.

තෙවන අදියරේදී, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි සියලුම ආයතන POS පද්ධති භාවිතය කෙරෙහි අවධානය යොමු කෙරෙන අතර, මෙම වසර අවසන් වන විට එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. මේය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සහ කාලරාමුව නිශ්චිතව දක්වමින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් වැඩිදුර සන්නිවේදනයන් නිකුත් කරනු ඇති අතර එකතු කළ අගය මත බදු පනතට අවශ්‍ය සංශෝධන හඳුන්වා දීමට නියමිතය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රියාවලීන් සඳහා ක්‍රියාකාරීව පහසුකම් සපයන අතර සියලුම එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි පුද්ගලයින්ට සහාය වීමට කැපවී සිටී. විවිධ මට්ටමේ ව්‍යාපාර සතුව ඇති ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධති හෝ ඒකාබද්ධ කිරීමට හැකියාවන් ඇති වෙනත් අදාළ විසඳුම් සහිත පද්ධති දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති වෙබ් API හරහා ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සමඟ බාධාවකින් තොරව ඒකාබද්ධ කිරීමට හැකි අතර ඒ හරහා ඔවුන්ට ඩිජිටල් අනුකූලතාවයක් සහ සැලසුම්සහගත හෝ තත්‍ය කාලීන දත්ත හුවමාරුවක් සඳහා පහසුකම් ලබා ගත හැක.

ඩිජිටල් ඉන්වොයිස් මුලපිරීම ශ්‍රී ලංකාවේ බදු පරිපාලනය නවීකරණය කිරීම සඳහා තැබූ වැදගත් පියවරක් නියෝජනය කරයි. අදියරගත ක්‍රියාත්මක කිරීම තුළින්, විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ ආදායම් එකතු කිරීම ශක්තිමත් කරන අතරම ව්‍යාපාරවලට සහාය වන සමබර ප්‍රවේශයක් සහතික කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙ හි අරමුණයි.

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**